# කෘෂිකර්ම අමාත්‍යාංශය

# ජනතා වතු සංවර්ධන මණ්ඩලය

## ඇබෑර්තු

## කළමනාකරු (මූල්‍ය) තනතුර

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනය වෙනුවෙන් මුදල් රෙගුලාසි ඇතුළු රජය විසින් හඳුන්වාදී ඇති නියමයන් හා ආයතනික මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති යටතේ මූල්‍ය කටයුතු සැලසුම් කිරීම, මූල්‍ය කළමනාකරණය සිදුකිරීම, අධීක්ෂණය කිරීම සහ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු වාර්තා කිරීමට අදාළව කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජවේදී හෝ ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

   සහ

   උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබාතිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර JM සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

පත්වීමේ ස්වභාවය : ස්ථිර පදනම.

වැටුප : MM 1-1 රු. (53,175 - 10 X 1,375 - 15 X 1,910 - 95,575)

අනෙකුත් දීමනා : සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල හා ජීවන වියදම් දීමනාව සඳහා හිමිකම් ඇත.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වෙනත් : සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිලධාරියෙකු තෝරාගනු ඇත. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2021.02.03 වන දින හෝ ඊට ප්‍රථම **සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75වොක්ෂෝල් පටුමග, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති**
**ජනතා වතු සංවර්ධන මණ්ඩලය**